**මන්නාරම නගර සභාව**

**මන්නාරම දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 31 දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතුව තිබුණි. කෙසේ වුවද ඒවා විගණනය සඳහා ඉදිරිපත් කරන ලද්දේ 2011 ජූනි 29 දිනදී වන අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද්දේ 2010 ජූනි 30 දිනදීය.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනියන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මන්නාරම නගර සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1:3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට මන්නාරම නගර සභාවේ ක්‍රියාකාරත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතයවේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශයන් පිළබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකිශයන්හි අනාවරණය කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ලැබී තිබුණු රු.554,472 ක් වූ බලපත්‍ර ගාස්තු සාවද්‍ය ලෙස සභාවේ ආදායමක් ලෙස සලකා තිබුණු අතර ඒ හේතුවෙන් සභාවේ ආදායම ඒ හා සමාන මුදලකින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයන්ට අදාළ එකතුව රු. 1,144,457 ක් වූ වියදම් විවිධ ණය හිමියන් (උපචිත වියදම්) ගිණුමට ගලපනු වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස සලකා තිබුනි. එහි ප්‍රතිපලයක් වශයෙන් සමාලෝචිත වර්ෂයේ වියදම ඒ හා සමාන මුදලකින් වැඩියෙන් දක්වා තිබුණි.

**1.3.3 බැංකු සැසඳුම්**

(අ) වටිනාකම රු. 3,348 ක් වූ මාස 06ක කාලපරිච්ජේදයක් ඉක්ම වූ උපලබ්ධි නොවූ තැන්පතු සම්බන්ධයෙන් බැංකුවෙන් විමසීමෙන් අනතුරුව පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) වටිනාකම රු.165,181ක්වූ අගරු චෙක්පත් 14 ක් සම්බන්ධයෙන් උතුරු පළාත් මුදල් රෙගුලාසි අංක 237 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම.**

**විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් නොකිරීම**

විගණනයට අවශ්‍ය තොරතුරු නොමැතිවීම නිසා වටිනාකම රු.13,090,246 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.5 අනුකූල නොවීම්**

පහත සඳහන් නීති, රීතී, හා රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්හි විධිවිධානයන්ට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| **(අ) නගර සභා ආඥා පනත** | | |
| VII පරිච්ජේදයේ 159 (ඊ) වගන්තිය | - | රු.5000 ඉක්ම වූ සංග්‍රහ වියදම් සඳහා විෂයය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද, අනුමැතිය ලබානොගෙන ආහාර පාන සඳහා රු.19,946 ක් ගෙවා තිබුණි. |
| **(ආ) නගර සභා මුදල් රෙගුලාසි** | | |

(i) III වැනි පරිච්ඡේදයේ 99 වැනි වගන්තිය - වෙනත් ආදායම් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.
(ii) IX වැනි පරිච්ඡේදයේ 212 වැනි වගන්තිය - මුදල් සහ ගබඩා විෂයයන් පරිහරණය කරනු ලබන නිලධාරීන්ගෙන් ආරක්ෂක ඇප ලබාගෙන නොතිබුණි.
(iii) IX වැනි පරිච්ඡේදයේ 222 වැනි වගන්තිය - ණයගිම් ලේඛණය නිසි පරිදි පවත්වා නොතිබුණි.

(ඇ) රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 437 - ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ රක්ෂණය කරනු වෙනුවට වාහන 02ක් පෞද්ගලික රක්ෂණ සමාගමක රු.21,038 කට රක්ෂණය කර තිබුණි.

## 2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය
---------------------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිපල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.3,729,125 ක්වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,341,208 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය
-----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම
-------------------------------------------------------------------

ලේකම්වරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් සහ බදු | 1,033 | 722 | 3,768 | 405 | 886 | 3,462 |
| කල්බදු කුලී | 9,711 | 8,044 | 5,590 | 6,467 | 5,385 | 5,086 |
| බලපත්‍ර ගාස්තු | 2,244 | 3,665 | - | 1,585 | 1,913 | - |
| වෙනත් ආදායම් | 29,157 | 30,421 | 361 | 1,409 | 1,826 | - |

### 2.2.2 මුද්දර ගාස්තු

----------------

සභාව වෙත ලැබිය යුතු මද්දර ගාස්තු ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 වියදම් ව්‍යුහය

----------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා අයවැයගත සහ තථ්‍ය වියදම සහ විචලනයන් පහත දැක්වේ.

| **වියදම් විෂයය** | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත | තථ්‍ය | විචලනය | ඇස්තමේන්තුගත | තථ්‍ය | විචලනය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| පුනරාවර්තන වියදම | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 22,504 | 21,570 | 934 | 18,080 | 18,670 | (590) |
| වෙනත් වියදම් | 9,034 | 8,687 | 347 | 13,209 | 4,072 | 9,137 |
| උප එකතුව | 31,538 | 30,257 | 1,281 | 31,289 | 22,742 | 8,547 |
| ප්‍රාග්ධන වියදම් | 5,500 | 12,627 | (7,127) | 10,809 | - | 10,089 |
| මුළු එකතුව | 37,038 | 42,884 | (5,846) | 42,098 | 22,742 | 18,636 |

### 2.4 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

**අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව**

--------------------------------------

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික මට්ටම | 02 | - |
| ද්විතීය මට්ටම | 15 | 19 |
| ප්‍රාථමික මට්ටම | 45 | 46 |
| වෙනත් (අනියම්/තාවකාලික) | - | 38 |
| එකතුව | 62 | 103 |

**2.5 වත්කම් කළමනාකරණය**

----------------------------

**2.5.1 ලැබිය යුතු ගිණුම්**

---------------------

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.935,566 ක් වූ අතර වර්ෂ 01 ඉක්මවූ ලැබිය යුතු ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.429,800 ක් විය.

**2.5.2 අයවීමට ඇති සේවක ණය**

-------------------------------------

2010 දෙසැම්බර 31 දිනට අයවීමට තිබුණු සේවක ණය ශේෂයන්ගේ එකතුව රු.6,498,100 ක් වූ අතර වර්ෂ 01 කට අධික කාලයක් හිඟහිට පැවති ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.13,100ක් විය.

**2.5.3 සමීක්ෂණය නොකළ වත්කම්**

--------------------------------

2010 දෙසැම්බර් 31 දිනට භෞතික පරීක්ෂණ/ සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් සනාථ නොකොට පොත් අගය මත ගණනය කළ වත්කම්වල වටිනාකම රු.228,372,589 ක් විය.

**2.6 ප්‍රමාණවත් අධිකාර බලයකින් සනාථ නොකළ ගනුදෙනු**

------------------------------------------------------------

විෂය භාර අමාත්‍යවරයාගේ නිසි අධිකාර බලයකින් තොරව සංස්කෘතික උත්සවයකට සහයෝගීතාවය දැක්වීම සඳහා රු.10,000 ක මුදලක් පරිත්‍යාග කර තිබුණි.

**2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

සභාව සැපයුම්කරුවන්ගෙන් රු.603,749 ක් වු රැඳවුම් බදු අයකරගෙන නොතිබුණි.

**2.8 කාර්යසාධනය**

-----------------

සභාව ගිණුම් වර්ෂය ආරම්භයේදී වාර්ෂික ක්‍රියාකර් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. එම නිසා. ඉටු කිරීමට අපේක්ෂිත අරමුණු සහ එහි ප්‍රගතිය සොයා දැනගැනීමට නොහැකි විය.

**2.9 අභ්‍යන්තර විගණනය**

------------------------

ආයතනයේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 3. පද්ධති සහ පාලන

---------------------

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වාහන උපයෝජනය

(ඉ) වත්කම් කළමනාකරණය